**පානදුර නගර සභාව**

**කළුතර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 05 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පානදුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2015 හා 2016 වර්ෂය වල මුද්දර ගාස්තු බිල් කිරීම රු.12,816,489 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.15,598,459 ක් ලෙස දැක්වීම හේතුවෙන් මුද්දර ගාස්තු හා සමුච්චිත අරමුදල් ගිණුම්වල ශේෂයන් රු.2,781,970 ක් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කල යුතුය. | 2015 ,2016 වර්ෂවල මුද්දර ගාස්තු බිල් කිරීමට වඩා වැඩිපුර ලැබී ඇති බැවින් එම මුදලද 2019 බිල් කලද ණයගැති ලෙස ගිණුම්ගත කිරීමට නොහැකි වු බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ඉටු නොකල ව්‍යාපෘති 17 ක් සඳහා රු.14,782,862 ක ණයහිමි ප්‍රතිපාදන සලසා තිබුණි. | ශිවිසුම් අත්සන් නොකල හා වැඩ ආරම්භ නොකල ව්‍යාපෘති සඳහා ණයහිමි වෙන් නොකල යුතුය. | ගිවිසුම් අත්සන් කර වැඩ ආරම්භ කර අවසන්ව නොතිබු ව්‍යාපෘති වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන වෙන් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (iii) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් හා පරිත්‍යාග ලෙස රු.6,221,373 ක් මෝටර්රථ ගිණුමට හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමට සටහන් කර ඇතත්, වර්ෂය තුල රු.5,800,000 ක පරිත්‍යාගයක් පමණක් ලැබී තිබීම නිසා එම ගිණුම්වල රු.421,373 ක් වැඩියෙන් දක්වා තිබුණි. | තක්සේරු කල වටිනාකම ගිණුම්ගත කළ යුතුය. | පරිත්‍යාග ලෙස ලද රු.221,373 ක් වු කම්පැක්ටර් රථය තක්සේරුවේදී රු.5,800,000 ක් ලෙස තක්සේරු කල බව දන්වමි. |
| (iv) | 2018 වර්ෂය වෙනුවෙන් ගෙවු රු.682,131 ක විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදමක් වශයෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | දෝශයක් සිදු වී ඇති බව දන්වමි. |
| (v) | වර්ෂ අවසාන තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරිම වෙනුවට රු.7,649,976 ක් වු පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | ගබඩාවේ තොග ශේෂය රු.7,549,375 ක් බවත්, ගබඩා තොගයට ආයුර්වේද තොගය එකතු වී රු.7,649,976 ක් වී ඇති බව දන්වමි. |
| (vi) | සමාලෝචිත වර්ෂය තුලදී ලැබුණු රු.152,671 ක් වු සේවක ණය පොලී සේවක ණය ගිණුමට බැර කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. | 2020 අවසන් ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව මෝටර් රථ හා කරත්ත ගිණුමේ ශේෂය රු.57,135,411 ක් වුවත් ඊට අදාල උපයෝගි ලේඛන අනුව ශේෂය රු.51,356,829 ක් වීමෙන් රු.5,778,582 ක වෙනසක් විය. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කිරිමට කටයුතු කල යුතුය. | නව වාහන තක්සේරුව අනුව ශේෂය රු.51,356,829 බවත්, මෝටර් සයිකලයේ vat අගය රු.21,418 ක් අඩුකර පෙන්වා ඇති බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| යාවත්කාලීන කරන ලද උපලේඛන හා සමීක්ෂණ වාර්තා නොමැතිවීම නිසා එකතුව රු.22,671,427 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කල යුතුවේ. | ඉදිරියේදි නිවැරදි කිරිමට කටයුතු කරමි. |

1. 4 අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) 1988 නගර සභා ආඥා පනත | | | | |
| (i) 164 (2) වගන්තිය | | 1968 අංක 14 දරන සංචාරක මණ්ඩල සංවර්ධන පනත යටතේ සංචාරක මණ්ඩලයේ අනුමත හෝටල් 02 කින් බලපත්‍ර ගාස්තු අයකර ගෙන නොතිබුණි. | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ආයතන වලින් බදු අය කල යුතුය. | එක් ආයතනයක් සංචාරක මණ්ඩලයට බදු නොගෙවන බවත් , අනිත් ආයතනය සමඟ සාකච්ජා කරමින් පවතින බව දන්වමි. |
| (ii) 165 (ඇ) වගන්තිය | 553,600 | පෞද්ගලික ආයතනයක් විසින් නිව් ලීඩ්ස් පාරේ පිඹුරු අංක 3756 ට අදාල ඉඩම් වෙන්දේසියේදී සියයට එකක බදු මුදල් ලබාගෙන නොතිබුණි. | විකුණුම් මිලෙන් සියයට 01 බදු මුදල් අයකරගත යුතුය. | මුදල් ගෙවීමට කල් ඉල්ලා ලිපියක් යොමු කර ඇති බව දන්වමි. |
| (iii) 170 (2) වගන්තිය | | හිඟ වරිපනම් බදු අයකර ගැනීමේ අවසන් පියවර ලෙසට දේපල තහනම් කිරිම් කර නොතිබුණි. | හිඟ වරිපනම් බදු අයකර ගැනිමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී දේපල තහනම් කිරිම් සිදු කර හිඟ වරිපනම් බදු අය කිරිමට කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2008 ජනවාරි 25 දිනැති අංක1533/16 දරන ගැසට් පත්‍රය | ව්‍යාපාර ආයතන 14 ක් සඳහා පරිසර බලපත්‍ර නිකුත් කර නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබාගත යුතු ආයතන සඳහා බලපත්‍ර නිකුත් කළ යුතුය. | සිහි කැඳවීම් ලිපි යවා ඇති බව දන්වමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයේ 3.1 ඡේදය | සභාවේ වාහන 21 ක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. | වාහන වල ඉන්ධන දහනය වාර්ෂිකව පරීක්ෂා කලයුතුය. | 2020 සැප්තැම්බර් 30 දිනට පෙර ඉන්ධන දහනය පරීක්ෂා කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.7,469,855 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.50,657,789 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 44,701,000 | 49,240,528 | 48,011,856 | 20,014,097 | 45,200,000 | 47,666,748 | 35,586,717 | 18,851,021 |
| (ii) | කුලී | 8,516,000 | 5,017,916 | 1,385,391 | 3,632,525 | 5,305,000 | 5,289,224 | 1,568,451 | 3,720,773 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,193,000 | 386,000 | 386,000 | - | 350,000 | 506,478 | 506,478 | - |
| (iv) | වෙනත් ආදායම් | 45,802,000 | 38,000,000 | - | 70,502,070 | 55,000,000 | 55,000,000 | - | 147,218,030 |
| | | 101,212,000 | 92,644,444 | 49,783,247 | 94,148,692 | 105,855,000 | 108,462,450 | 37,661,646 | 169,789,824 |

## 2.2.2 ආදායම් රැස් කිරිමේ කාර්ය සාධනය

### (අ) වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ථ වරිපනම් බදු හිඟය රු.19,896,000 ක් වු අතර එකී ශේෂය තුල වර්ෂ 03 ත් 05 ත් අතර රු.1,645,413 ක් හා වර්ෂ 05 ට වැඩි රු.1,314,792 ක් පැවතුනි. | දීර්ඝ කාලීන හිඟ අය කිරිම සඳහා වැඩ පිළිවෙලක් සකස් කල යුතුය. | රටේ පවතින වර්තමාන තත්ත්වය මත හිග ආදායම් අය කිරිමේ ප්‍රමාදයක් පවතින බව දන්වමි. |

### (ආ) කර්මාන්ත හා ව්‍යාපාර බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.65,840 ක් වු කර්මාන්ත හා ව්‍යාපාර බදු ගිණුමේ හිඟ ශේෂය වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ බදු අයකල යුතුය. | මේ සම්බන්ධයෙන් නිතීමය කටයුතු සිදු කර ඇති බවත්, අයවීම සම්බන්ධව වාර්තා නොමැති බව හා උසාවියේ ශුන්‍ය ශේෂයක් පවතින බව දන්වා ඇත. |

### (ඇ) වෙළඳ ස්ථාන කුලී

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.3,819,290 ක් වු වෙළඳ ස්ථාන කුලී හිඟ ශේෂයෙන් රු.333,410 ක් පමණක් 2020 ජුනි 30 දිනට අයකර ගෙන තිබුණි. | හිග කඩකුලී කඩිනමින් අයකර ගත යුතුය. | 2019 දෙසැම්බර් 31 දිනට වු හිඟයෙන් 2020 ජුලි 03 දිනට අයවිය යුතු හිඟ කඩ කුලිය රු.3,483,881 ක් බව දන්වමි. |
| (ii) සමාලෝචිත වර්ෂයට අදාලව රු.4,680,000 ක් වු වෙළඳ ස්ථාන කුලී බිල් කිරීම් වලින් 2020 ජුනි 30 දිනට රු.3,565,484 ක් හෙවත් සියයට 76 ක් අයවිය යුතුව තිබුණි. | හිග කඩකුලී කඩිනමින් අයකර ගත යුතුය. | වාර්ෂික බිල් කිරීම් වලින් 2020 ජුලි 03 දිනට රු.3,565,484 ක් අයවිය යුතුව පවතින බව දන්වමි. |

### (ඈ) ත්‍රී රෝද රථ ගාස්තු අය කිරිම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 වර්ෂයේ සමීක්ෂණ වාර්තා අනුව සභාව සතු රථගාල් වල ත්‍රි රෝද රථ 679 ක් ඇති බවට වාර්තා කර තිබුණ ද වර්ෂය තුල ත්‍රි රෝද රථ 300 කට පමණක් අවසර පත්‍ර නිකුත් කිරීම නිසා අවසරයකින් තොරව සභා රථ ගාල් වල තිබෙන ත්‍රි රෝද රථ 379 කින් අයවිය යුතු රු.379,000 ආදායමක් සභාවට අහිමි වී තිබුණි. | සභා රථ ගාල් වල තිබෙන සියළු ත්‍රි රෝද රථවලින් ගාස්තු අයකළ යුතුය. | සභා තීරණයක් මත ත්‍රි රෝද රථ 379 ක් සඳහා අවසරපත්‍ර නිකුත් නොකල බව හා පවතින ත්‍රි රෝද රථ අතුරු ව්‍යවස්ථාව සංශෝධනය කර නව අතුරු ව්‍යවස්ථාවක් පනවන බව හා 2019 සැප්තැම්බර් 05 දිනැති සභා තීරණය පරිදි ගාස්තු අය කරන බව දන්වමි. |

(ඉ) වෙන්දේසි ඉඩම් වලින් බදු අය කිරීම

| | | |
|---|---|---|
| සභා බල ප්‍රදේශය තුල සිදු කරන ලද ඉඩම් වෙන්දේසි 04 කින් රු.1,854,568 ක මුදලක් බදු වශයෙන් අයකර තිබුණ ද ඒ සඳහා ඉඩම්වල විකුණුම් වටිනාකම සලකා බලා නොතිබුණි. | විකුණුම් වටිනාකම මත බදු අයකළ යුතුය. | තක්සේරු දෙපාර්තමේන්තුවේ තක්සේරු වටිනාකම් හා ඔප්පු පිටපත් පරික්ෂා කර හිඟ මුදල් අය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2.2.3 මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.70,502,070 ක් විය. | හිඟ ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී මෙම ගාස්තු ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

# 3 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගී සේවා, පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය යන සුභ සාධනය සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ක්‍රියාකාරි සැලැස්ම | | |
| 2019 වර්ෂය සඳහා ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර තිබුණ ද , එකී සැලැස්මෙහි වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදනය කල මුදල් උපයෝජනය කර ගන්නා ආකාරය හඳුනාගෙන නොතිබුණි. | අයවැය ලේඛනය මගින් ප්‍රතිපාදනය කල මුදල් උපයෝජනය කර ගන්නා ආකාරය ක්‍රියාකාරි සැලැස්මේ දැක්විය යුතුය. | 2019 සඳහා හඳුනාගැනීමක් සිදු නොකල බවත්, 2020 වර්ෂය සඳහා නිවැරදිව ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කල බව දන්වමි. |
| (ආ) තිරසර සංවර්ධන ඉලක්ක | | |
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 17 ක් හඳුනාගෙන තිබුණ ද ඒවා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය | 2020 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර ඇති බව දන්වමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රජා මණ්ඩල පිහිටුවීම | | |
| ග්‍රාම නිලධාරි වසම් 19 ක් සඳහා ප්‍රජා මණ්ඩල පිහිටුවා තිබුණේ 01 ක් පමණක් වූ අතර, සභාවේ ප්‍රජා අංශයේ දායකත්වය මත 2019 වර්ෂයේදී ඉටුකර තිබුණේ ව්‍යාපෘති 17 ක් පමණි. | ප්‍රජා අංශයේ කටයුතු කාර්යක්ෂමව ඉටු කල යුතුය. | ස්ථිර ප්‍රජා සංවර්ධන නිලධාරියෙකුගේ ඌනතාවය නිසා එම අංශයේ කටයුතු කඩිනම් කල නොහැකි බව දන්වමි. |
| (ආ) ගර්භිත තත්ත්වයේ පවතින පොදු වෙළඳපොල ගොඩනැගිල්ල | | |
| 1993 හා 1994 වර්ෂවලදී නිම කරන ලද වර්ග අඩි 25,830 ක විශාලත්වයකින් යුතු පොදු වෙළඳපොල සංකීර්ණ ගොඩනැගිල්ල පිළිබඳව 2016 අගෝස්තු 24 දින ජාතික ගොඩනැගිලි පිළිබඳව පර්යේෂණ ආයතනය විසින් ලබාදෙන ලද වාර්තාව අනුව ගොඩනැගිල්ලෙහි කොන්ක්‍රීට් ව්‍යුහය දිරාපත් වී තිබීම නිසා අළුත්වැඩියා කිරීම ඵලදායි නොවීම හා ගොඩනැගිල්ල භාවිතා කරන්නන්ට අනතුරුදායක තත්ත්වයක් ඇතිවිය හැකි බැවින් කඩා ඉවත් කලයුතු බව ආනාවරනය කර තිබුණු අතර 2020 මැයි මාසය දක්වා මෙම ගොඩනැගිල්ල කඩා ඉවත් නොකර වෙළඳසැල් පවත්වාගෙන යමින් තිබුණි. තවද, 2017 ජුලි 04 දින පැවති පාර්ලිමේන්තු ගිණුම් කාරක සභා වේදී ද මෙම කරුණ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියා මාර්ග වෙත යොමුවන ලෙස නියෝග කර ඇතත්, එකී නියෝගය ක්‍රියාත්මක කර නොතිබුණි. | කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය. | තාවකාලික වෙළඳ කුටි ඉදිකර පැරණි ගොඩනැගිල්ලෙහි සිටින වෙළඳමහතුන් එම පරිශ්‍රයෙන් ඉවත් කර අනතුරුදායක ගොඩනැගිල්ල ඉවත් කිරීමට කඩිනම් පියවර ගන්නා බව දන්වමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (i) ලේකම් තනතුරේ වැඩ බැලීම සඳහා කළමනාකරණ සහකාර අධි ශ්‍රේණියේ නිලධාරිණියක පත් කර තිබුණි. | ස්ථිර පදනමින් නිලධාරියෙකු අනුයුක්ත කරවා ගතයුතු වේ. | පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කර ඇති බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ii) ගණකාධිකාරි, මහජන සෞඛ්‍ය පරික්ෂක හා පුස්තකාලාධිපති තනතුරු වලද තාක්ෂණ නිලධාරි තනතුරකද, කළමනාකරණ සහකාර තනතුරක හා ආදායම් පරික්ෂක තනතුරු 03 ක, පෙර පාසැල් ගුරු තනතුරක, වැඩ ක්ෂේත්‍ර පරීක්ෂක තනතුරක, රියදුරු තනතුරු දෙකක හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 14 ක පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන කොමසාරිස් වෙත වාර්තා කර ඇති බව දන්වමි. ප්‍රාථමික තනතුරු බඳවා ගැනීම් තාවකාලිකව නතර කර ඇත. |

(ආ) වැටුප් රහිත නිවාඩු
-------------------------

| | | |
|---|---|---|
| 2019 වර්ෂය තුල සේවකයින් 15 ක් දින 830 ක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇතත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | දිගින් දිගටම වැටුප් රහිත නිවාඩු ලබා ගන්නා සේවකයින් සම්බන්ධයෙන් ක්‍රියා මාර්ග ගත යුතුය. | විනය ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති. |

3.4 වත්කම් කළමණාකරණය
----------------------------

වාහන උපයෝජනය
------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ අබලි තත්ත්වයේ සුන්බුන් ලෙස පවතින වාහන 05 ක් අපහරණය කිරිමට කටයුතු කර නොතිබුණි. | අපහරණ කටයුතු කඩිනම් කළ යුතුය. | අපහරණය කිරිමට කටයුතු කරමින් සිටින බව දන්වමි. |